මොරටුව මහා  නගර සභාව

කොළඹ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 අගෝස්තු 21 දින ද සභාවට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | -------------------------- | --------------- | ------------------------------------- |
| (i) | ඉකුත් වර්ෂයන්ට අදාළව පැහැර හරිනු ලැබූ එකතු කල අගය මත බදු වෙනුවෙන් පනවා තිබූ රු.421,328 ක දඩ මුදල ගෙවීමට සභාව විසින් එකඟතාවය පළකර තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මේ සඳහා  ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නියමිත කාලපරිච්ඡේදය තුළ අවශ්‍ය කටයුතු කළ යුතු වේ. | දඩ මුදල ඉවත් කිරීම සඳහා සහනයක් සලසා ගැනීමට 2017 දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියවා ඇතත් මේවන විටත් ඊට පිළිතුරක් ලැබී නොමැත. නිරවුල් කිරීමට නොහැකි වුවහොත් ඉදිරි වර්ෂයේ ගිණුම්වලදී ගිණුම්කරණ සටහන්වලින් හෙළිදරව් කිරීමට සටහන් කර ගතිමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ අවසානයට අතැති තොග ශේෂය රු.6,346,987 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ගිණුම් තැබීමේදී මේ දක්වා තොගය ලෙස ගෙන ඇත්තේ ඉන්ධන තොගය හා ආයුර්වේද තොගය පමණි .ඉදිරියේදී ගිණුම් තැබීමේදී අතැති සියලුම තොග ගිණුම් තැබීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |
| (iii) | ඉකුත් වර්ෂයේදී, ද සොයිසා ක්‍රීඩාංගණය වෙන් කිරීමේදී අයකළ යුතු ගාස්තුවලට වඩා අඩුවෙන් ගාස්තු අයකිරීම නිසා අවස්ථා 07 ක දී සභාවට අහිමි වූ රු.234,500 ක්  අයකර ගෙන නොතිබූ | ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | අයකළයුතු ගාස්තුවලට වඩා අඩුවෙන් ගාස්තු අයකිරීම සිදුකර ඇත්තේ එම ක්‍රීඩා තරග  111පන්තියේ ක්‍රීඩා තරග ලෙස සලකා ඇති නිසාය. ඉදිරියේදී එම අහිමි වූ මුදල නිරවුල් කිරීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | අතර එම මුදල ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | කරන බව සඳහන් කරමි. |
| (iv) | 2019 දෙසැම්බර් 31 දිනට අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවිය යුතු මුදල රු.30,664,945 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම මුදල රු.27,017,684 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි ශේෂ ගිණුම් ගත කළ යුතුවේ. | ශේෂය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 03 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපලේඛනයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.2,975,407 ක් වැඩියෙන් සහ රු.12,110,331 ක් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | සේවක ණය , හිඟ වරිපනම් හා අගරු වෙක්පත් යන ගිණුම්වල ශේෂ හා උපලේඛණ අනුව ශේෂ අතර පවතින වෙනස හඳුනාගෙන ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.47,105,982 ක් වටිනා ලැබිය යුතු ශේෂ 14 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල වර්ෂ ගණනාවක සිට පැවත එන සංවර්ධන සංචිතය රු.10,000 ක් සහ නිදන් අරමුදල් ශේෂය රු.89,210 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | වර්ෂ ගණනාවක සිට පැවත එන සංවර්ධන සංචිතය හා නිදන් අරමුදල් ශේෂ නිරවුල් කිරිමට කටයුතු කරන බවද දන්වමි. |

(ඇ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.215,887,025 ක් වූ ගිණුම් විෂයයන් 17 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ තහවුරු කර ගැනීම සඳහා උපලේඛන හෝ අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම්**

1.4.1 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| | **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට වලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- | --- | --- |
| (අ) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 218 වගන්තිය | නගරාධිපතිවරයා විසින් එක් එක් මුදල් වර්ෂය තුලදී සභාවේ පරිපාලනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඇතුලත් වාර්ෂික පරිපාලන වාර්තාව සභාව සහ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 218 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මු.රෙ.756 | රු.400,488,986 ක් වූ ස්ථාවර වත්කම් සහ අතැති තොගය සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | මු.රෙ. 756 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අබලි භාණ්ඩ වෙන්දේසි කටයුතු අවසන් කිරීම 2019.11.01 දින සිදු කර ඇත. එහෙයින් නියමිත කාල සීමාව තුළ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | 2009 අංක 08 දරන මෝටර් වාහන (සංශෝධන) පනත | | | |
| | 16 වන ජේදය | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව රථයේ මුල් ස්වභාවය වෙනස්වන පරිදි වාහන තුනක් රු.3,713,500 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. | පනතේ 16 වන ජේදය අනුව කටයුතු කල යුතුවේ. | HC - 1800 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයාගේ අනුමැතිය ලැබී ඇත.<br>PB - 7688 රථයේ අනුමැතිය ලබා ගැනීම |

| | | | |
|---|---|---|---|
| | | | සඳහා ඉල්ලුම් කර ඇත.<br>226 - 2031 රථය අළුත්වැඩියා කළ නොහැකි කාර්මික දෝෂයක් හේතුවෙන් ධාවනයෙන් ඉවත් කර ඇත. |

**1.4.2 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

| | | | |
|---|---|---|---|
| (අ) | මහා නගර සහා ආඥා පනත (252 අධිකාරය) 188(1) උපවගන්තියට අනුව මහා නගර සහා අරමුදල ප්‍රයෝජනයට ගත නොහැකි ආකාරයේ ගණුදෙනුවක් වන සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා 2015 හා 2016 වර්ෂවලදී සභා අරමුදලින් පිළිවෙලින් රු.953,715 ක් හා රු.1,086,807 ක් වශයෙන් එකතුව රු.2,040,522 ක් ගෙවීම් කර තිබුණද සභාවට අයවිය යුතු රු.1,703,022 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සිදුව ඇති පාඩුව අයකළ යුතුවේ. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | මහා නගර සහා ආඥා පනතේ (252 අධිකාරිය) 188(1) වගන්තියට අදාළව 289 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගවලට පටහැනිව නාගරික මන්ත්‍රීවරුන් 41 දෙනෙකු සඳහා ජංගම දුරකථන ලබාදීම වෙනුවෙන් සභා අරමුදලින් රු.615,000 ක් ගෙවා තිබුණි. | මහා නගර සහා ආඥා පනත (252 අධිකාරය) 188 (1) උපවගන්තියට පටහැනිව කටයුතු නොකළ යුතුවේ. | වර්තමාන සමාජය තුළ අත්‍යවශ්‍ය මෙන්ම ජනප්‍රිය උපකරණයක් ලෙස මෙම දුරකථන භාවිතා වේ.<br>ස්ථාවර දුරකථන ගාස්තු සමඟ සසඳා බැලීමේදී ජංගම දුරකථන ගාස්තුද වර්තමානයේ පවතින තරඟකාරී තත්ත්වය තුළ ඉතා සීඝ්‍රයෙන් පහළ බැස ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,888,075 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.503,990 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සහා ආඥා පනතේ (**252** අධිකාරය) 206 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 20 කදී රු.260,414,300 ක් අයිරා පහසුකම් ලබාගෙන තිබුණු අතර බැංකු ප්‍රකාශනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට පැවැති අයිරා ශේෂය රු.15,515,963 ක් විය. | අයිරා පහසුකම් ලබා ගැනීම අවම කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.5,144,199 ක ශේෂයක් ඇති සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමේ මුදල් නගරයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගෙන නොතිබුණි. | සංවර්ධන ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | සාමාන්‍ය වියදම් දැරීම සඳහා මෙම ගිණුමේ මුදල් වැය කිරීමට නොහැකි අතර නාගරික සංවර්ධන අධිකාරියේ නිසි අනුමැතිය මත නගරයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා මෙම මුදල් වැය කරනු ලැබේ. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2019** | | | | **2018** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | (රු.) **'000** | (රු.) **'000** | (රු.) **'000** | (රු.) **'000** | (රු.) **'000** | (රු.) **'000** | (රු.) **'000** | (රු.) **'000** |
| **වරිපනම් හා බදු** | 126,200 | 117,577 | 95,561 | 154,778 | 126,700 | 113,828 | 106,384 | 157,037 |
| **කුලී** | 35,000 | 12,507 | 12,614 | 2,930 | 13,024 | 12,676 | 12,780 | 2,786 |
| **බලපත්‍ර ගාස්තු** | 29,325 | 22,097 | 21,733 | 2,933 | 22,976 | 24,308 | 24,482 | 2,933 |
| **වෙනත් ආදායම්** | 667,663 | 602,412 | 586,651 | 125,998 | 680,265 | 508,316 | 524,686 | 109,828 |

### 2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් වටිනාකම රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 170 කින් අයවිය යුතු හිඟ වරිපනම් බදු රු.65,386,348 ක් විය. | වරිපනම් බදු ආදායම අය කර ගැනීමට නොපමාව කටයුතු කළ | රජයේ දේපල මෙන්ම බදු සහන ලබා දිය යුතු දේපලවල වරිපනම් බදු හිඟයන්ද පවතින අතර ජංගම |

| | | | |
|---|---|---|---|
| | | යුතුවේ. | සේවාවන් පැවැත්වීම හා දේපල තහනම් කිරිමේ මගින් හිඟ මුදල් අය කර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2019 ජනවාරි 01 දිනට ලැබිය යුතු රු.51,555,323 ක ව්‍යාපාර බදු ශේෂයෙන් රු.50,384,523 ක් හෙවත් සියයට 97 ක් අයවී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී බිල් කරන ලද වටිනාකම රු.7,877,100 ක් වුවද ඉන් රු.50,384,523 ක් හෙවත් සියයට 98 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | ලැබිය යුතු ව්‍යාපාර බදු ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ව්‍යාපාර බදු ලෙජර යාවත්කාලින කිරිමේදි සිදු වි ඇති ප්‍රමාද දෝෂයක් බැවින් එය නිවැරදි කිරිමට 1998 ට පෙර වර්ෂ ගණනාවක් ආපස්සට ලේඛණ පරීක්ෂා කළ යුතුව ඇති බැවින් ඉදිරි කාලයේදි හැකි ඉක්මණින් එම කටයුතු අවසන් කර මෙය නිරවුල් කිරිමට කටයුතු කරමි. |

**2.3.3 කුලී**

-----

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------------ |
| (අ) | මධ්‍යම වෙළඳ පොලෙහි කඩ කාමරයක් 2015 වර්ෂයේ සිට ද දිගරොල්ල දිනපොලෙහි කඩ කාමර 9 ක් 2011 වර්ෂයේ සිට ද බදු දී නොතිබුණි. | බදු දීමට කටයුතු කළ යුතුවේ. | දිගරොල්ල දිනපොළෙහි කඩ කාමර 10 ක් බදු දීමට ලංසුපත් කැඳවා ඇතත් කිසිදු ලංසුවක් ඉදිරිපත් වී නොමැත. මාසික මහා සභා වාර්තාවේ අංක 6(9) 2(1) යටතේ ඉහත කඩ කාමර බදු දීමේදී අය කරනු ලබන පෙර මුදල් හා ආරක්ෂිත ඇප තැන්පත් මුදල සියයට 50 කින් අඩු කර නැවත ලංසුපත් කැඳ වුවද ලංසු කිසිවක් ඉදිරිපත් නොවීය.<br><br>විදුලි මීටර් සහිත කාමර දෙක, කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනාගාරය හා අලෙවි සැල බදු දීම සිදු නොකරයි. |
| (ඇ) | වාරික 10 ට වැඩි හිඟ හිටි දේපල 26 කින් රු.951,557 ක කඩකුලී අයවිය යුතුව පැවතුණි. | කඩ කුළී අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | ලේඛනවලින් කපා හැරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය පිණිස ඉදිරිපත් කර ඇත. |

2.4 අධිභාර

--------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| ----------------------- | ------------- | ---------------------------------- |
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.760,173 ක් අයකර ගැනීමට තිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහා නගර සභා ආඥා පනතේ 04 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබූ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට රු.20,101,581 ක් වූ හිඟහිටි කසළ බදුවලින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,255,790 ක් පමණක් අයකර ගෙන තිබුණි. | ලැබිය යුතු කසල බදු අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. | දැනට සමීක්ෂණයන් සිදු කර ගෙන යන අතර වසා දමා ඇති ආයතන මොනවාද යන්න තහවුරු කර විධිමත් පරිදි ලේඛණයෙන් ඉවත් කිරිමටත් අනෙකුත් ආයතන මගින් ගාස්තු අයකර ගැනිම සඳහාත් කටයුතු කරනු ලැබේ. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | වර්ෂ ගණනාවක සිට පැවත එන වරිපනම් බදු වංචා කිරීමෙන් සිදු වූ අලාභය වන රු.381,969 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. අලාභයෙන් රු.241,749 ක් නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ අයකර ගැනීමට 2011 පෙබරවාරි 14 දින විනය නියෝගයක් ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානවන තුරුද අය කිරීමට කටයුතු කර නොතිබුණි. | අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සභාවට පාඩු වූ මුදලින් රු.100,000 ක් විශ්‍රාම පාරිතෝෂිකයෙන් එකවර අය කිරීමටත් ඉතිරි මුදල ඇයගේ හිග විශ්‍රාම වැටුපෙන් අය කර ගැනීමටත් විනය නියෝග ලබා දී ඇත.<br><br>ඒ අනුව වයස අවු. 55 සම්පූර්ණ වී විශ්‍රාම ගැන් වූ පසු ඉදිරි කටයුතු කරනු ලැබේ. |
| (ආ) | 1999 අගෝස්තු 10 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් අගතියට පත් පාර්ශවයට රු.3,001,717 ක් ගෙවීමට වැරදිකරු වූ රියදුරුට නියම වී තිබූ අතර එම මුදල සභා අරමුදලින් ගෙවා තිබුණි. 2019 පෙබරවාරි 28 දින වන විට රියදුරුගෙන් රු.112,205 ක් පමණක් අයකර තිබුණි. ඒ අනුව සභාවට අයවිය යුතු රු.2,889,512 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූලික විමර්ශනයක් සිදුකළ යුතු අතර අලාභය අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් ආරම්භ කර ඇති අතර, එහි තීරණය ලැබුණු පසු ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.1,549,200 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබු අතර 2015 සිට 2019 වර්ෂය දක්වා කාලය තුලදී සභාව විසින් ගෙවන ලද රු.1,088,565 ක් සහ ඉතිරි මුදල ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගෙන නොතිබුණි. | මු.රෙ. 156 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | අංක 1329 මුදල් දරන සැලසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජුලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවු රු.11,602,308 ක් මුදල් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 156 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඉ) | සභාව විසින් 2000 සිට 2003 වර්ෂය දක්වා අවස්ථා 11 කදී ලබාදුන් අත්තිකාරම් මුදල් රු.43,822 ක් පියවා නොගැනීම නිසා සභා අනුමැතියකින් එම ශේෂ කපා හැර තිබුණද මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 266 වගන්තිය අනුව කපා හැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මු.රෙ. 156 ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වවුචර් ගොනු ද අපහරණය කර ඇති බැවින් මහ නගර සභා ආඥා පනතේ 266(අ) වගන්තිය ප්‍රකාරව කපා හැරීමට 2018.12.06 දින පැවති මාසික සභා රැස්වීමේදී තීරණය විය. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 96 ක් පැවතුණි. මින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන ලේකම්වරයා , පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇති අතර, පුරප්පාඩු පිරවීමට කටයුතු කරමි. |
| (ආ) | ව්‍යාපෘති , කොන්ත්‍රාත්, තාවකාලික හා ආදේශන පදනම මත තනතුරු 04 ක් සඳහා බඳවාගෙන තිබු සේවකයන් 55 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.7,398,680 ක් ගෙවා තිබුණි. | සේවකයන් බඳවා ගැනිමේදි විධිමත් අනුමැතියක් ලබා ගත යුතු අතර වර්ෂය මුලදි අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතුවේ. | සභාවේ වැඩ කටයුතු අඛණ්ඩව පවත්වා ගෙනයාම සඳහා අනුමත ව්‍යාපෘතීන් සඳහා සේවකයින් බඳවා ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | බඳවා ගත් තනතුරින් බැහැරව වෙනත් රාජකාරී වල සේවකයන් 36 දෙනෙකු යොදවා තිබුණි. | නිත්‍ය තනතුරේ රාජකාරි සඳහා යොදා ගැනිමට කටයුතු කළ යුතුවේ. | සේවා අවශ්‍යතාවය මත රාජකාරී කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා පුරප්පාඩු පුරවන තෙක් නිත්‍ය තනතුරෙන් බැහැරව මෙසේ සේවයට යොදවා ගෙන ඇත. මේ වන විටත් ඉන් බොහෝ දෙනෙකු නියමිත තනතුරුවලට අනුයුක්ත කර ඇත. |
| (ඇ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ස්ථිර පත්වීම් ලබාදුන් සේවකයන් 112 දෙනෙකු 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ මෙම සේවකයින් සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු.36,060,932 ක් ගෙවා තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් කර වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවකයන් 11 දෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සඳහා විස්තර නියමිත ආකෘති පත්‍ර මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. |
| (ඉ) | වැඩ තහනම් කල හා සේවය හැරගිය නිළධාරීන් 32 දෙනෙකුගෙන් රු.819,721 ක් ද මියගිය හා විශ්‍රාම ගිය නිළධාරීන් 16 දෙනෙකුගෙන් රු.307,951 ක් ද ස්ථාන මාරු වී ගිය නිලධාරින් 12 දෙනෙකුගෙන් රු.1,008,575 ක් ද වශයෙන් එකතුව රු.2,136,247 ක් වු ණය ශේෂ වලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | වැඩ තහනම් කල හා සේවය හැරගිය නිලධාරින් 32 කුගෙන් 2019 වර්ෂය තුල මුදල් අයවීමක් නොමැති නමුත් තවදුරටත් අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. 4 දෙනෙකුන් හැරෙන්න ඉතිරි නිලධාරින් වාරික වශයෙන් ගෙවීම් සිදුකරනු ලබයි. |
| (ඊ) | අක්‍රිය ණය ශේෂ ලේඛනයේ ඇතුළත් නිලධාරින් 128 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය වු රු.1,573,627 ක් නිරවුල් කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ඇපකරුවන්ගෙන් හෝ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019.12.31 දක්වා අක්‍රිය ණය ලේඛණයේ සඳහන් කිසිදු ණය මුදල් ගෙවා නොමැති නමුත් තවදුරටත් අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ) | සොයිසා ක්‍රීඩාංගනයේ ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ක්‍රිකට් පුහුණු වීමේ තීරු දෙකක් වර්ෂ දෙකක කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබූ අතර එම තීරු වෙන් කිරීම සඳහා සවිකර ඇති දැල් ඉරී ගොස් ඉතා අබලන් තත්ත්වයේ පැවතුණි. එමෙන්ම දෙපස තීරු වල සවිකර ඇති මර්කරි බල්බ් 10 ක් අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් ආදායම් ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇති අඩුපාඩුද සහිතව ද සොයිසා ක්‍රීඩාංගනයේ නවීකරණ කටයුතු ක්‍රීඩා අමාත්‍යාංශය හා ක්‍රිඩා පාලක මණ්ඩලය සමඟ සිදු කිරිමට නගරාධිපතිතුමා ක්‍රීඩා කමිටුවේදී නිර්දේශ කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සොයිසා ක්‍රීඩාංගනය තුල "මොරටුව ක්‍රීඩා සමාජය" නමින් දෙමහල් ගොඩනැගිල්ලක් ස්ථාපනය කර බදු දී තිබූ අතර එම ගොඩනැගිල්ල සභාවේ අවසරයකින් තොරව සමාජ ශාලාවකට (Club House) හා ශරීර සුවතා මධ්‍යස්ථානයකට "මොරටුව ක්‍රීඩා සමාජය" විසින් උප බදු දී පිළිවෙළින් මසකට රු.25,000 ක් හා රු.30,000 ක් බැගින් උපයා තිබුණි. එමෙන්ම ක්‍රිකට් තරඟ පවත්වන දිනවල මොරටුව ක්‍රීඩා සමාජය විසින් විශාල මුදලක්ද උපයන බව අනාවරණය විය. | ගිවිසුම අනුව කටයුතු කළ යුතුවේ. | ද සොයිසා ක්‍රීඩාංගනය මොරටුව මහා නගර සභාව සතු නිත්‍යානුකූල දේපළක් බැවින් දැනට එම භූමියෙහි පවත්වා ගෙන යනු ලබන මොරටුව ක්‍රීඩා සමාජය සතු සියළු බඩු බාහිරාදිය ඉවත් කර ගෙන ගොඩනැගිල්ලේ අයිතිය මෙම සභාව වෙත භාර දෙන මෙන් එම ක්‍රීඩා සමාජයට දන්වා ඇතත්. මේ වන තෙක් ඉවත් වී නොමැත. මෙම භූමියෙන් ඉවත් නොවන්නේ නම් නීතිමය පියවර ගැනිමට කටයුතු කිරිමට අපේක්ෂා කරන්නෙමි. |
| (ඇ) | දිවා, රාත්‍රී සේවය සපයන ගිනි නිවීමේ අංශය තුල නිලධාරීන් 09 දෙනෙකුගේ තනතුරු 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | ගිනි නිවීමේ අංශය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය අයිතම 26 කට අදාළ උපකරණ 256 ක් ගිනි නිවීමේ අංශයේ නොතිබුණි. | අත්‍යවශ්‍ය සේවාවක් වන ගිනි නිවීමේ අංශය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | පළාත් පාලන ආයතනයක් වශයෙන් දැරීමට අපහසු බැවින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ගිනි නිවීම් ඒකකයට අවශ්‍ය යාන්ත්‍රික උපකරණ ලබා දීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | 1985 හා 2006 වර්ෂවල සභාව වෙත ලැබී තිබූ රු.2,600,000 ක් වටිනා ගිනි නිවීමේ රථ 2 ක් 2019 වර්ෂය අවසාන වන විටත් ලියාපදිංචි කර නොතිබුණි. | ගිනි රථ ලියාපදිංචි කළ යුතුවේ. | 1985 වර්ෂයේ ගිනි නිවන රථය සම්බන්ධයෙන් ලියාපදිංචිය සඳහා අවශ්‍ය තොරතුරු නොමැති අතර 2006.07.11 දින ජපන් ආධාර ලෙස ලබා දුන් වැයි අංක FD - 172B 22476 දරන ගිනි නිවන රථය සම්බන්ධයෙන් ලියාපදිංචි සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරගෙන යමින් පවතී. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මොරටුව මහා නගර සභාව සතු පර්චස් 371.8 ක් විශාල ඉඩම් 19 ක් භාවිතයට ගෙන නොතිබුණි. | සභාව සතු ඉඩම් භාවිතයට ගත යුතුවේ. | නගර සභාව සතු ඉඩම් හඳුනාගෙන ඒවා ලේඛනගත කිරීමේ වැඩසටහනක් මේ වන විට ක්‍රියාත්මක කර ඇති අතර නගර සභාව සතු හිස් ඉඩම් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | එන්ජිම අළුත්වැඩියා කිරීම ඇතුළු විවිධ කාර්මික දෝෂ නිසා වාහන 17 ක් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර එම වාහන වසර 02 සිට වසර 18 දක්වා කාලයක් අක්‍රියව පැවතුණද අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | එන්ජිම අළුත්වැඩියා නොකිරීම පමණක් නොව විවිධ කාර්මික දෝෂයන් හේතුවෙන් එකී වාහන ධාවනයෙන් ඉවත් කර ඇත. ඒවා අළුත්වැඩියා සිදු කර ධාවනයට යෙදවීම ඵලදායී නොවන බැවින් අපහරණයට යොමු කර ඇත. |
| (ඇ) | මොරටුව නගර මධ්‍යයෙහි පිහිටි රංගන ශාලාවේ ඉදිකිරීම් 1995 වර්ෂයේ ආරම්භ කර ඇතත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළ යුතුවේ. | මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයාගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නොහැකි වී ඇත. මූල්‍ය ප්‍රතිපාදන ස්ථිර වශයෙන් සපයාගත් වහාම ප්‍රසිද්ධ ලංසු කැදවීම් ආරම්භ කිරීමට හැකියාව ඇත. |
| (ඈ) | සභාව සතු නිල නිවාස 7 ක් 2009 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයක් තුළ භාවිතයට ගෙන නොතිබුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කළ යුතුවේ. | විශාල වශයෙන් අළුත්වැඩියා කටයුතු කළ යුතුව තිබූ මෙම නිවාස අළුත්වැඩියා කටයුතු කරමින් පවතී. |
| (ඉ) | මධ්‍යම වෙළඳපොළ ගොඩනැගිල්ලේ දෙවන මහල 2010 ඔක්තෝබර් 31 දිනෙන් පසු බදුදීමට කටයුතු කර නොතිබුණි. | මධ්‍යම වෙළඳපොළ ගොඩනැගිල්ල බදු දී ආදායම් ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ඊ) | නව විදුලි ජනක යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා ක්‍රියාත්මක තත්වයේ පැවති විදුලි ජනක යන්ත්‍රය 2010 ජූලි 28 දින සිට භාවිතයෙන් ඉවත්කර තිබූ අතර එය සභා පරිශ්‍රය තුළ නිශ්ක්‍රීයව පැවතුණි. | විදුලි ජනක යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (උ) | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් 2017 සැප්තැම්බර් 13 දින සභාව වෙත ලබා දී තිබූ රු.632,500 ක් වටිනා බේලිං යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | බේලිං යන්ත්‍රය ප්‍රයෝජනයට ගැනිමට හෝ අවශ්‍යතාවය ඇති වෙනත් ආයතනයකට ලබා දිය යුතුවේ. | බේල් කිරීම සඳහා රැගෙන එනු ලබන නොදිරන අපද්‍රව්‍ය ගබඩා කර තැබීමේ ගැටලුව හේතුවෙන් බේල් කිරීම තාවකාලිව අත්හිටුවන ලදි. ගබඩා ඉඩ පහසුකම් සහිත ස්ථානයක් හඳුනා ගත් පසුව නැවත නොදිරන අපද්‍රව්‍ය බේල් කිරීමේ කටයුතු ආරම්භ කිරීමට නියමිතව ඇති බව සඳහන් කරමි. |
| (ඌ) | ලුනාව ව්‍යාපෘතියෙන් ලද වාහන අමතර කොටස් ඒකක 1711 ක් 2010 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනිමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (එ) | පරම අයිතිය සභාව සතුව තිබුණු තක්සේරු වටිනාකම රු.මිලියන 102,000,000 ක් වූ හෙක්ටයාර් 0.7063 ක් වූ ලුනාව තානායම පිහිටි ඉඩම මහල් නිවාස ව්‍යාපෘතියක් සඳහා නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන තිබුණද අධිකාරිය වෙතින් මුදල් අයවී නොතිබුණි. | වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරු මුදල සභාව වෙත ලබාගැනීම සඳහා ගනු ලැබූ උත්සාහයන් පිළිබඳව දැනුවත් කර ඇත. අවසාන වශයෙන් 2019.12.12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් ද මෙ සම්බන්ධව ඉල්ලීමක් සිදුකර ඇත. |

**3.5.2 වාහන උපයෝජනය**

---------------------

| | | | |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ වර්ෂ 11 සිට වර්ෂ 33 දක්වා කාලයක් පැරණි වාහන 07 ක් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියකියවිලි නොමැති වීම හේතුවෙන් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි. | වාහන ලියාපදිංචි කළ යුතුවේ. | පරිත්‍යාගයන් ලෙස මොරටු මහා නගර සභාව වෙත ලබා දී තිබුණද ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියකියවිලි නොමැති වීම ගැටළුවක්ව පවතී. වැසි අංක FD-172B 22476 දරණ ගිනි නිවන රථයේ ලියාපදිංචිය වෙනුවෙන් තිබෙන තොරතුරු අනුව දැනටමත් කටයුතු කර ගෙන යමින් පවතී. |
| (ආ) | වාහන 11 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | වාර්ෂික ආදායම් බලපත්‍ර ලබාගත යුතු වේ. | විවිධ තාක්ෂණික දෝෂ හේතුවෙන් වසර කිහිපයක් ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණු හා අංක 25, 26, 27 යන වාහන වල ලියාපදිංචි සහතික අප සතුව නොමැති වීමෙන් ආදායම් බලපත්‍ර ලබා ගැනීමට නොහැකි වී ඇත. |

**4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 විගණන හා කළමනාකරණ කමිටු**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එකක් වන පරිදි විගණන හා කළමනාකරණ රුැස්වීම් පැවැත්විය යුතුවේ. | 2019 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පවත්වන ලදී. |